# මාධ්‍ය මර්දනයට එරෙහි ස්ත්‍රී විරෝධය

2009 වසර ආරම්භ වූයේ අසුභ නිමිත්තකිනි.

උතුරේ ත්‍රස්තවාදය පරාජය කිරීම පිළිබඳව රජය උදම් ඇනූ මොහොතේදීම දකුණේ ත්‍රස්තවාදි ක්‍රියාවන් මර්දනය කිරීමට රජයේ නොහැකියාව ප්‍රදර්ශනය විය.

රටේ පොදු ජනතාවගේ ජීවන රටාව කඩාබිඳ දමන උග්‍ර ආර්ථික ගැටළු සමඟ රටේ ප්‍රජාතන්ත්‍රවාදී ආයතනයන්ට එල්ල වන තර්ජන ද ගත් කළ 2009 වසර අප සැමට අසුභ වන ලකුණු පමණක් පෙනෙන්නට ඇත්තේ.

ජනතාවට තොරතුරු දැනගැනීමට සහ අදහස් ප්‍රකාශ කිරීමට ඇති ඉඩකඩ ද දිනෙන් දින ඇහිරේ. සිරස මාධ්‍ය ආයතනය විනාශ කිරීම සහ "Sunday Leader" කර්තෘ මහදවල් ප්‍රසිද්ධියේ ඝාතනය කිරීම පසුගිය දින කිහිපය තුළ අප කැළඹීමට පත් කළේ ලංකාවේ මාධ්‍ය මර්දනය කෙතරම් දරුණු ද, මිලේච්ඡ ද යන්න එයින් අපට පැහැදිලි වූ නිසාය. "Lanka Dissent" වෙබ් අඩවිය මේ සිදුවීම් හමුවේ ස්වේච්ඡාවෙන්ම තම පුවත් සේවය අත්හිටුවාලීම මෙහි එක් ප්‍රතිඵලයක් පමණි. වාරණය මේ තරම් කුරිරු වූ විටෙක, විසම්මුතියට පිළිතුර මාධ්‍යවේදීන් ඝාතනය කිරීම වූ විටෙක, මාධ්‍ය මර්දනයට එරෙහිව අප හඬ නගන්නේ නැතිනම් අප ද ප්‍රජාතන්ත්‍ර විරෝධී රැළේ කොටස්කරුවන් වනු ඇත.

මේ නිසා,

මෙරට ප්‍රජාතන්ත්‍රගරුක ස්ත්‍රී පුරවැසියන් වන අප
2009 ජනවාරි 12 වන දා
මාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංග අවසන් ගමන් යන මොහොතේ

**වික්‍රමතුංග ඝාතනය හෙළාදකිමු!**

**මේ ඝාතනය පිළිබඳව අපක්ෂපාත ජාත්‍යන්තර විමසුම් කමිටුවක් පත්කරන ලෙස රජයට බලකර සිටිමු!**

**මාධ්‍ය මර්දනයට මගපාදන හදිසි නීති රෙගුලාසි සහ ත්‍රස්තවාදී මර්දන පනත හකුළා දමමු!**

**මාධ්‍ය මර්දනයට එරෙහිව සටන් වදිමු යනුවෙන් සපථ කරමු!**

**ප්‍රජාතන්ත්‍රවාදය සඳහා ස්ත්‍රීන් එකමුතු වී**